බුද්ධිමත් පාඨකයෝ. එක එක ජාතියේ නිර්මාණකරුවෝ, කලාකරුවෝ රටේ ලෝකේ ඉන්නවා. ඒ ඒ අයට කැමති පිරිසකුත් ඉන්නවා. මාව තෝරාගන්නේ මා කියන දේ තේරෙන, තේරුම්ගන්න උත්සාහ කරන පිරිසයි. මට විශාල පාඨක පිරිසක් ඉන්නවා. ඒ නිසා මම හිතනවා මම සාර්ථකයි, නිවැරදියි කියලා. මම චිත්‍ර කතාවක් ඇන්දොත් විශාල පිරිසක් එය වටා එක්වෙනවා. පසුගිය කාලයේ මම ''කොන්දා'' කියලා චිත්‍රකතාවක් ඇන්දා. ඒකේ තියෙන්නේ නිදහස් අධ්‍යාපනය බේරාගන්න සටන් කිරීම නිසා පන්ති තහනමට ලක්වෙච්ච වෛද්‍ය ශිෂ්‍යයෙක් ගැන. මේ තරුණයා ජීවත්වෙන්න ඕනේ නිසා පන්ති තහනම ඉවත්වෙනකම් කොන්දොස්තර ජොබ් එකක් තෝරාගන්නවා. සමාජයේ කතාවක් තියනවානේ ඩොක්ටර් කොන්ඩොක්ටර් වෙනවා කියලා. ඔහුගේ බස් රථයේ ගමන් කරන සියළු දෙනාට පහසුවක් වෙන විදිහට සහ මුළු මහත් කොන්දොස්තරවරුන-ට'ම ආදර්ශයක් වෙන විදිහට ඔහු රැකියාව කරනවා. මේ කතාව සමාජය කොයි තරම් පිළිගත්තද කියනවා නම් ටෙලි නාට්‍යයක් බවටත් පත්වුණා. ජාතික රූපවාහිනියේ කොටස් 100ක් විකාශය වෙලා ගිය සුමානෙ තමයි ඉවර වුණේ. ටෙලි නාට්‍ය රසිකයන්ගෙන් සියයට අසූවක් විතර ඒ නාට්‍ය බැලුව කියලයි දැන් දැනගන්න තියෙන්නේ.

යනවා ''අනුරාලෝකය'' කියලා. මේ ප්‍රදර්ශණය ආරම්භ කළ අවස්ථාවේ රටේ දුර බැහැර පළාත්වල ඉඳලාත් විශාල සෙනගක් එය නැරඹීමට සහභාගි වුණා. ඒ නිසා අගනුවරින් බැහැරව ප්‍රධාන නගරවලත් ප්‍රදර්ශණය නොමිලේම පවත්වන්න මම තීරණය කළා. මාතර, අනුරාධපුර, කෑගල්ල, බොරලැස්ගමුව, නගරවලත් පේරාදෙණිය සහ ජයවර්ධන පුර විශ්වවිද්‍යාලවලත් මේ වනවිට පවත්වලා තියනවා. ඉදිරියේදී පිළියන්දල, සහ බණ්ඩාරවෙල නගරවල පවත්වන්න සූදානම් වෙනවා. රට පුරාම ප්‍රදර්ශණය ගෙනියන්න මගේ බලාපොරොත්තුවක් තියනවා. ඒ අතරේ ''අඳ'' පත්තරේට චිත්‍ර කතාවක් අඳිනවා. ප්‍රචාරක ආයතනවලින් ලැබෙන ඇණවුම්වලට චිත්‍ර අඳිනවා. ඔය වගේ තමයි.

**ඔබගේ මේ සියළු කටයුතු රට තුළට පමණක් සීමා වෙලාද?**

නෑ. අන්තර් ජාලය ඔස්සේ මට ලංකාවෙන් බැහැර ආයතනවල ඇණවුම් පවා ලැබෙනවා. ඒ වගේම මගේ නිර්මාණ ඇතුළත් වෙබ් අඩවියක් මම ආරම්භ කරලා තියනවා. පිට රටකින් ඉල්ලීමක් ලැබුණොත් මගේ චිත්‍ර ප්‍රදර්ශණය නොමිලේ පවත්වන්න මම බලාපොරොත්තු වෙනවා. මගේ වෙබ් අඩවියක් තියනවා www.anurasrinath.com





මම කරන දේ ජනතාව අනුමත කරන බවට, පිළිගන්න බවට එක උදාහරණයක් පමණයි ඒක.

**කලාකරුවෙක් සහ ජවිපෙ සාමාජිකයෙක් විදිහට 88/89 භීෂණය කාලෙදි මොනවගේ අත්දැකීම්වලටද මුහුණ දුන්නේ?**

එදා සිද්ධ වුණේ ආණ්ඩුව කළ භීෂණයට එරෙහිව නැගී සිටීමක්. ඒ කාලෙදි මගේ ක්‍රියාකාරි දේශපාලනයක් තිබුණේ නෑ. ඒ නිසා භීෂණයේ බලපෑම එදා මට ආවේ නැහැ. යම් විදිහකින් මාව පාවාදීමක් වුණා නම් අද මම නැතිව ඇති.

**වර්තමානයේ ඔබ ස්වාධීන චිත්‍ර ශිල්පියෙක් විදිහට කටයුතු කළත් කාලයක් තිබුණා ඔබ පත්තරවලට සම්බන්ධ වෙලා කටයුතු කළා. පත්තර ජීවිතය කොහොමද ?**

මම මුලින්ම පටන්ගත්තේ මල්ටි පැක්ස් කියන ආයතනයේ පත්තරවලින්. ''සුහඳ'' කියන පත්තරේට සති දහඅටක් චිත්‍ර කතාවක් අඳිද්දි 1980 ලංකාවේ උපාලි පුවත්පත් ආයතනය පටන්ගත්තා. ඒ අවස්ථාවේ මාවත් එතනට තෝරාගත්තා. රටේ හිටපු දක්ෂතම චිත්‍ර ශිල්පීන් 13 දෙනෙක් එතනට ගනිද්දි මොකක්දෝ හේතුවකින් ආධුනික මාවත් ඒ අය සම්බන්ධ කරගත්තා.

එතනට මා යොමු කළේ පී.ඒ. ලීලාරත්න කියන චිත්‍ර ශිල්පියා. උපාලි සමාගමේ ''චිත්‍රමිත්‍ර'' කියන චිත්‍ර කතා පත්තරෙන් පස්සේ 1984දි මම ''මල්සර'' කියන චිත්‍ර කතා පත්තරයට කතා ඇන්දා. 87 දි ''සුමිහිර'' පත්තරේට සම්බන්ධ වුණා. 88 ඉඳලා ''සිත්තර'' පත්තරේට චිත්‍ර කතා ඇන්දා. ඊට පස්සේ ''සිව්රස'', ''වරුණ'', ''සත්සිරි'' වගේ පත්තර ගණනාවකට සම්බන්ධ වෙලා වැඩකළා.



**දශක තුනකටත් වැඩි කාලයක් චිත්‍ර ශිල්පියෙකු ලෙස කටයුතු කරමින් සිටින ඔබ මේ වන විට මොනවගේ කටයුතුවලටද මුල්තැනදී තියෙන්නේ?**

2012 වසරේ කොළඹ කලා භවනෙන් පටන් අරගෙන මම දැනට මගේ චිත්‍ර ප්‍රදර්ශණයක් පවත්වගෙන කියලා. මගේ නිර්මාණ විශාල ප්‍රමාණයක් එහි තියනවා. ලෝකයේ කොහේ හිටියත් බලන්න පුළුවන්.

**ඔබගේ ප්‍රකාශන අතර තියන චිත්‍ර කතා පොත්, අපිට මෙතෙක් හුරු පුරුදුව තිබුණ චිත්‍ර කතා පොත්වලට වඩා වෙනස් බවක් දකින්නට ලැබෙනවා. චිත්‍ර නවකතා පොත් වගෙයි පෙනෙන්නේ. මේ පොත්වලට ලැබෙන ප්‍රතිචාර මොනවගේද?**

මගේ චිත්‍ර කතා පත්තරවල ගියාට පස්සේ තවදුරටත් පාඨකයන් අතරට ගෙනියන්න තමයි මම ඒ කතා මේ විදිහට පොත් ආකාරයෙන් මුද්‍රණය කරන්නේ. එහෙම පොත් කීපයක් මේ වෙනකොට ප්‍රකාශයට පත්කරලා තියනවා. අපිට වෙළඳාම ගැන දක්ෂතාවක් නැති නිසා මේවා ජනතාව අතරට යනවා අඩුයි. නමුත් මගේ ප්‍රදර්ශණය පැවැත්වෙන අවස්ථාවලදී ඒවාට ලොකු අලෙවියක් තියනවා.

**මේ කටයුතුවලට අමතරව දැන්වීම් සහ යම් යම් නිර්මාණවලට අදාළව පූර්ව කතා එලක නිර්මාණය කිරීමේත් ඔබ නිරත වෙනවා. මේක සාමාන්‍ය ජනතාවට ඇස නොගැසෙන නිර්මාණ කටයුත්තක් නේද?**

ඒවාට කියන්නේ ''ස-ටෝරි බෝඩ්'' කියලා. සිංහල වචනයක් නැහැ. ඒක දැනට ලෝකේ පුරා සිදුවන දෙයක්. චිත්‍රපටියක්, ටෙලි නාට්‍යයක්, දැන්වීමක් හදන්න ඉස්සෙල්ලා ඒකට අදාළ කතාව සහ දෙබස් සම්පූර්ණයෙන්ම ලියලා අවසන් වෙලා අධ්‍යක්ෂවරයා, කතා රචකයා, නිෂ්පාදකයා යන සියළු දෙනාම එක් වෙලා මේ කතාව චිත්‍රයට නගනවා. එකින් එක රූපරාමු අඳිනවා. එතකොට ඒ ගැන අදහසක් එනවා. නිර්මාණය කරන්න සියළු දෙනාටම පහසුවක් ඉන් ඇතිවෙනවා. මම චිත්‍ර කතා අඳින කාලේ ඉඳලාම මේ ස්ටෝරි බෝඩ් අඳින එකත් කරගෙන ගියා. මගේ ස්ටෝරි බෝඩ්වලට විශාල ඉල්ලුමක් තියනවා.

''ජාතික චිත්‍රකතා පදනම'' කියලා ලංකාවේ චිත්‍ර ශිල්පීන් එකතුවෙලා සංගමයක් ආරම්භ කළා. චිත්‍ර කතා කලාව ලංකාවේ අභාවයට ගියත් එදා චිත්‍ර කතා ඇන්ද ශිල්පීන් රාශියක් අදටත් ජීවත්වෙලා ඉන්නවා. ඒ අය වෙනත් කටයුතුවල යෙදෙනවා. එවැනි අය එකතු කරගෙන ''ටෝක්ස් අන්ඩ් ජෝක්-ස්'' කියලා චිත්‍ර කතා සංග්‍රහයක් ප්‍රකාශයට පත්කළා. නමුත් විවිධ අපහසුතා නිසා අපිට ඒක සඟරා පහකින් නවත්තන්න සිදුවුණා. පිටරටවල නම් චිත්‍ර කතා එන්න දියුණු වුණා.

**මේ සියළු කටයුතු කරගෙන යන අතරේ ගොඩනැගුන පෞද්ගලික ජීවිතය මොනවගේද?**

මගේ වැඩිමල් පුතා වෙබ් ඩිවලොපින් මැනේජර් කෙනෙක් විදිහට රැකියාව කරනවා. දෙවනියා දුව. එයා ඉන්ටීරියර් ඩිසයිනර් උපාධිය හදාරමින් සිටිනවා. බාල පුතා මහානාම විද්‍යාලයේ ගණිත අංශයෙන් අධ්‍යාපනය ලබනවා. මගේ බිරිය ගෙදර සිටිමින් මගේ කටයුතුවලට විශාල වශයෙන් උදව් වෙනවා. ඇය අඩුතරමින් මාව බඩුවක් ගේන්න කඩේ යවන්නේවත් නෑ. මගේ සියළු දේ කරන්නේ ඇය විසින්. ඒ නිසා මට මගේ වෘත්තීය කටයුතු කරගෙන යන්න විශාල පහසුවක් ලැබිලා තියනවා. පෞද්ගලික දෙයක් කියලා මගේ අතින් කෙරෙන්නේ කන බොන ටික විතරයි.

**ඉදිරියේදී මොන වගේ නිර්මාණවලටද යොමුවෙන්න බලාපොරොත්තු වෙන්නේ?**

මම දැනට විශාල ප්‍රමාණයෙන් පේන්ටින්ස් නිර්මාණකරණයේ යෙදෙනවා. ඉදිරියේදී රටේ ස්වාභාවික ස්ථාන කීපයක්ම ඒ විදිහට අඳින්න මගේ බලාපොරොත්තුවක් තියනවා. සීගිරිය මැදට ගිහිල්ලා එහි ඉහළ සහ පහළ පේන ප්‍රමාණයෙන් අඳින්න මම බලාපොරොත්තු වෙනවා. ඊළගට ලෝකාන්තය අපිට පේන ප්‍රමාණයෙන් අඳින්න බලාපොරොත්තුවක් තියනවා. ඒ විදිහට සුවිශේෂී පේන්ටින්ග්ස් ටිකක් නිර්මාණය කරන්නයි මට ඕනේ.

පැය 24 පුරා ලොවම අමතන ගුවන්විදුලිය - තිසර
www.thisara.com

MONT ALBERT DENTISTS P/L
For all Your Dental Requirements
We Provide
GENERAL DENTAL TREATMENT
COSMETIC DENTAL
TEETH WHITENING
PARTIAL/FULL DENTURES
EMERGENCY SERVICES
WE ACCEPT COMMUNITY DENTAL VOUCHERS, TEEN VOUCHERS, ALL PRIVATE HEALTH INSURANCES AND MEDICARE VOUCHERS FOR APPROVED PATIENTS.
FOR APPOINTMENTS
9890 3609
DISCOUNTS FOR FAMILIES, FREE CHECK UPS FOR KIDS UNDER 7 YEARS
DR. ENOKA JAYATILAKEBANDA (BDS)
MONT ALBERT DENTISTS
2A CHURCHILL ST
MONT ALBERT VIC 3127
(CLOSE TO BOX HILL CENTRAL)
www.montalbertdentists.com.au